# පාලි හා බෞද්ධ අධ්‍යයන*

ඩේවිඩ් ජේ. කලුපහන

බුදුසමය අධ්‍යයනය කිරීමෙහි නියැලී සිටින විද්වත්හු, පාලි බුදුසමය, සංස්කෘත බුදුසමය, ජපන් බුදුසමය, ටිබෙට් බුදුසමය හා චීනය මෑතකදී කොරියන් බුදුසමය යනාදී වශයෙන් එහි විවිධ ස්වරූපයන් පිළිබඳව සඳහන් කරති. එබැවින් පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ තිස්වන සංවත්සරෝත්සවය පැවැත්වෙන මෙම අවස්ථාවේදී මදක් නැවතී 'පාලි හා බෞද්ධ අධ්‍යයන' යන පාඨයෙහි අර්ථය සහ එහි වැදගත්කම ගැන මෙනෙහි කිරීම අවස්ථෝචිතය.

මෙම ආයතනය පිහිටුවීමෙහිලා පුරෝගාමී වූ අද අප අතර නැති ආචාර්ය හැවන්පොල රතනසාර හිමිපාණන්ගේ අභිප්‍රාය කුමක්වීදැයි විමසා දැනගැනීම අද අපට කළ නොහැකිය. සමීප මිතුරන් සහ ශිෂ්‍ය සමකාලිකයන් වශයෙන් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙහි අපගේ ආචාර්ය උපාධිවලට සූදානම් වෙමින් සිටි අවදියේදී බුදුසමය පිළිබඳව උන්වහන්සේ දැරූ අදහස් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ අවස්ථාව කොතෙක් විට මට ලැබුණි. නිර්මාණාත්මක අදහස් වලින් පිරිපුන් යතිවරයෙකු උන්වහන්සේ තුළින් මට දිස්වූ අතර පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනය සැලසුම් කිරීමේ දී උන්වහන්සේ විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලද බව නිසැකය. එහෙත් ආයතනය පිහිටුවීමට වසර තුනකට පෙර මා දිවයිනෙන් බැහැර ගිය බැවින් එහි සංවිධානය පසුබිමෙහි පැවැති අභිප්‍රාය කුමක්දැයි

---

* වර්ෂ 2005 දෙසැම්බර් මස 09 දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණු පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනයේ 30 වන සංවත්සර උත්සවයේ ප්‍රධාන දේශනය